**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය - 2022**

----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදය ප්‍රකාරව, ප්‍රමිතය මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල රු.මිලියන 7.77ක බැර ශේෂ රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල හර ශේෂ වලින්ද, වෙළඳ ණයහිමියෝ හර ශේෂ රු.මිලියන 0.39ක් වෙළඳ ණයහිමි බැර ශේෂයෙන්ද, රෝහලේ කාර්යමණ්ඩලය සඳහා නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් දරන ලද රු.මිලියන 172.45ක් හා ආගමික පූජකවරුන් හා අනෙකුත් අය වෙත නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් දරන ලද රු.මිලියන 60.49ක් රෝහල් ගාස්තු ආදායමෙන්ද හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ පිළිබඳව පෙර වර්ෂවලදීද පෙන්වා දී තිබුණද අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | රෝහල් ගිණුම්කරණ කටයුතු සිදුකරන Accpac ගිණුම්කරණ පද්ධතිය තුළ ණයගැති හා ණයහිමි උප ගිණුම්වල 2016 වර්ෂයේ සිට සිදුවී තිබූ වැරදි නිවැරදි කිරීමට හා ණයගැතියන්ගේ ණයලිපිවල තිබූ දෝෂ මෙන්ම ණයහිමියන්ගේ භාණ්ඩ ලැබීම් පත්‍රිකා (GRN) වල තිබූ වැරදි නිවැරදි කිරීම් සිදුකරන ලද බව, ඉදිරියේදී Systolic පද්ධතිය තුළ ණයගැති ගිණුම් සැකසීමට කටයුතු කරන බැවින් මෙම වැරදි ඉදිරියේදී නිවැරදිවනු ඇති බව, රෝහලේ කාර්යමණ්ඩල වෛද්‍ය ප්‍රතිකාර සඳහා යන වියදම ඉදිරියේදී කාර්යමණ්ඩලයේ වියදමක් ලෙස ඇතුළත් කිරීමට හා ආගමික පූජකවරුන්ගේ ප්‍රතිකාර සඳහා වැයවූ මුදල පොදුකාර්ය වියදමක් ලෙස පෙන්වීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 3,681.26 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි . ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දැනට මෙම කටයුත්තෙහි සියයට 30 පමණ නිවැරදිකර ඇති අතර ඉතිරිවී ඇති Medical equipment ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය විශේෂඥ දැනුම රෝහල සතුව නොපවතින බැවින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ නිලධාරීන් සමඟ කටයුතු කරමින් හැකි ඉක්මණින් මෙම කටයුත්ත අවසන් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත 2022 වර්ෂයට අදාලව ලැබී තිබුණු රු.මිලියන 44.9 ක ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රෝහලේ කාර්යමණ්ඩලයට නොමිලේ ලබාදුන් ඖෂධ සඳහා වූ වියදම රු.මිලියන 72.47 ක් කාර්යමණ්ඩල වියදම් යටතේ නොදක්වා සමාලෝචිත වර්ෂයේ ද්‍රව්‍ය හා පරිභෝජන ද්‍රව්‍ය වියදම්වලින් අඩුකර දක්වා තිබුණි. | රෝහලේ කාර්යමණ්ඩල වෛද්‍ය ප්‍රතිකාර සඳහා යන වියදම ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රෝහල විසින් 2022 වර්ෂය තුළ ඉඩම් හා ගොඩනැගිලි යන වත්කම්වලට අදාල ප්‍රත්‍යාගණන වාර්තා 2022 ඔක්තෝබර් 09 දින හා 2022 ඔක්තෝබර් 25 දිනයන්හිදි ලැබී තිබුණි. රෝහල විසින් 2022 ජනවාරි 01 දින සිට ප්‍රත්‍යාගණන අගයන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණනය කරන ලද දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ක්ෂය නොකිරීම හේතුවෙන් ක්ෂය වීම් හා ප්‍රත්‍යාගණන සංචිතය රු.මිලියන 25.34 ක් අඩුවෙන් දැක්වුණි. එසේම ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වලට අදාලව විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් තක්සේරු ලිපියේ දිනට ප්‍රත්‍යාගණනය නොකර 2022 ජනවාරි 01 දින සිට ප්‍රත්‍යාගණනය කර එම අගයන් මත වත්කම්වලට ක්ෂය ගණනය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.මිලියන 210.02 කින් වැඩියෙන් හා ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී රඳවාගත් ලාභයට ගැලපීම් කිරීමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | රෝහලට අයිති ඉඩම රු.මිලියන 4,845.50 කට ප්‍රත්‍යාගණනය කිරීමේදී ඉඩමේ ප්‍රමාණය ලෙස සලකා තිබුණේ හෙක්ටයාර් 9.8047 ක ප්‍රමාණයකි. රෝහල සතු ඉඩමේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 10.0229 වූයෙන් හෙක්ටයාර් 0.2182 ඉඩම් ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ඉඩමේ නිවැරදි සැලසුමේ සඳහන් භූමි ප්‍රමාණයට නැවත තක්සේරුකිරීමට කටයුතු කරන බව. | සම්පූර්ණ ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ වෘත්තිය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීමේ නිශ්චිත හා නිසි ක්‍රමවේදයක් මහාරෝගාශාලා මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණු අතර වෘත්තිය ගාස්තු ආදායම වූ රු.මිලියන 404.57 ක් ගෙවිය යුතු වෘත්තිය ගාස්තු ගිණුමට බැර කර, සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් ගෙවා තිබුණු වෘත්තිය ගාස්තු රු.මිලියන 377.29 ක් එම ගිණුමට හර කර තිබුණි. ණයලිපි (Credit Letter) මත රෝහලින් බැහැරව යන රෝගීන්ගේ රෝහල් ගාස්තුව හා වෘත්තීය ගාස්තුව නිශ්චිත හඳුනාගැනීමකින් තොරව 2022 දෙසැම්බර් 31 දින රෝහල් ගාස්තු ආදායම් ගිණුමෙන් රු.මිලියන 50.83 ක් ගෙවිය යුතු වෘත්තිය ගාස්තු ගිණුමට බැර කර තිබුණි. එසේම 1998 වර්ෂයේ සිට පවතින රු.මිලියන 3.61 ක්වූ ගෙවිය යුතු වෘත්තිය ගාස්තු ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | 2022 ඔක්තෝබර් මාසයේ සිට වෘත්තිය ගාස්තු රෝහල් බිල්පතට ඇතුළත් කිරීමට කටයුතු කරන ලද බව, Systolic පද්ධතිය හා AccPac ගිණුම් පද්ධතිය ඒකාබද්ධකිරීමට (Link) කටයුතුකර ඇති බැවින් Credit Note මඟින් බැහැරයන රෝගීන්ගේ වෘත්තිය ගාස්තු ඉදිරියේදී නිවැරදිව හඳුනාගත හැකිවන බව හා 1998 වර්ෂයේ සිට පැවත එන වෘත්තිය ගාස්තු ශේෂයන් ආදායමක් ලෙස හඳුනාගැනීමට කටයුතු කරන බව. | වෘත්තිය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් සම්බන්ධව ප්‍රතිපත්තියක් පිළියෙල කර ඒ අනුව අයකිරීම් හා ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඊ) | Systolic පද්ධතියේ සිදුවන GRN ඉවත් කිරීම් Accpack පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන නොවීම, Accpack පරිගණක පද්ධතියේ GRN දෙවරක් සටහන් වීම සහ අගයන් වෙනස් වී සටහන්ව තිබීම, Accpack පරිගණක පද්ධතියෙන් මුදල් ගෙවීම සිදු වුවත් එම ගෙවීම් කේවල ණයහිමි ශේෂ වලට ගලපා නොතිබීම හා කේවල ණයහිමි ශේෂ තුළ දඩ මුදල් හා ප්‍රමාද ගැලපුම් ගාස්තු සිදුකර නොතිබීම යනාදී හේතු මත 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ ණයහිමියෝ රු.මිලියන 3 කට වැඩි අගයක් ලියා හැර තිබුණි. මෙම වැරදි නිවැරදි කිරීම් සඳහා ජ'නල් වවුචර් පිළියෙල කිරීමකින් තොරව හා අදාල ගැලපුම් පෙර වර්ෂ ගැලපුම් ගිණුම මඟින් සිදු කිරීමකින් තොරව ශුද්ධ ශේෂය රු.160,365 ක් සමුච්චිත ලාභලාභ ගිණුමට ගලපා තිබුණි. | Accpac ශේෂ පද්ධතිය තුළ වැරදි නිවැරදි කිරීම් කළ හැක්කේ Debit Note හා Credit Note මඟින් පමණක් බව හා මේ සඳහා ජර්නල් වවුචර් භාවිතා කළ නොහැකි බව. මෙම ගැලපුම් පෙර වර්ෂ ගැලපුම් ගිණුමක් මඟින් සිදුකර ඇති බව, එම පෙර වර්ෂ ගිණුමේ ශේෂය වූ රු.160,365 ක මුදල ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ණයගැතියන් පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව බොල් ණය සඳහා පිළිගත් ක්‍රමවේදයට අනුව සියයට 5 ක් වෙන් කිරීම් කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස බොල්ණය වෙන් කිරීම් රු.මිලියන 7.89ක් අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.මිලියන 7.89ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙම වෙනස රඳවාගත් ලාභයට ගැලපුම් කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ඌ) | 2016 සිට 2021 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු.මිලියන 18.97 ක කේවල ණයගැති ශේෂ 05 ක් සම්බන්ධයෙන් එම මුදල් අයකර ගැනීමට හෝ සුදුසු අනුමැතීන් මත ගිණුම්වලින් ඉවත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | එම මුදල් අයකරගැනීමට හෝ කපාහැරීමට කටයුතු කරන බව . | මෙම මුදල් අයකරගැනීමට හෝ සුදුසු අනුමැතීන් මත කපාහැරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ණයගැති ශේෂය තුළ පැවති රෝගීන්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 19.96 ක රෝහල් ගාස්තු සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්වලින් කපාහැර තිබුණද ඊට අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2016 වර්ෂයේ සිට පවතින අගය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත ක්‍රියාකරන බව. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | වැඩ පූර්ව අත්තිකාරම් රු.මිලියන 17.99 ක් අත්තිකාරම් ලෙස නොදක්වා මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. මෙම මුදලින් 2018 හා 2020 වර්ෂයන්හි වැසිකිළි පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘති 02 කට අදාලව වැඩ පූර්ව අත්තිකාරම් එකතුව රු.මිලියන 9.48 ක් නිරවුල් වී තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ඊට අදාල ගැලපීම් කර නොතිබුණි. | මෙම වැඩ පූර්ව අත්තිකාරම් අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී පමණක් කෙරීගෙන යන වැඩ උපලේඛනයේ පෙන්නුම් කරන ලද බව හා නිරවුල් වී ඇති රු.1,152,547 ක හා රු.8,326,769 ක මුදල ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2021 වර්ෂයේදී කාන්තා නේවාසිකාගාර ගොඩනැගිල්ල රු.මිලියන 64.36 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කිරීමද කෙරීගෙන යන වැඩ ගිණුමෙන් රු.මිලියන 72.95 ක් වැඩියෙන් ඉවත් කිරීමද පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේදිද ඊට අදාල නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ, ණයගැතියෝ, ආපදා ණය හා ආපදා ණය පොලී යන විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ඉදිරිපත් කළ ලැයිස්තු, ලේඛණ හා පරිගණක වාර්තා අනුව රු.මිලියන 42.02 ක වෙනසක් පැවති අතර වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි. | මෙම වෙනස්කම් හදුනාගැනීම සඳහා හා නිවැරදි කිරීම් 2023 වර්ෂයේ සිට ආරම්භකර ඇති බව. ආපදා ණය ශේෂ වාර්තාවල අදාල වෙනස්කම්වලට හේතු සොයාබැලීමට විෂය භාර නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් දත්ත අදාල උපලේඛන, ලැයිස්තු සහ පරිගණක වාර්තා සමඟ ගැලපිය යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 1,025.06 ක්වූ රෝහල් ගාස්තු ණයගැතියන්, වෙළඳ ණයහිමියන් හා සේවා ගාස්තු යන ගිණුම් විෂයයන් 03 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති සහ උපයෝගී ලේඛණ ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනිමට නොහැකි විය. | ඉල්ලා ඇති පරිදි කාලසීමාවන් වෙනස් කළ හැකිදැයි සොයාබලා පිළිතුරක් ලබාදෙන බව.<br>අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සොයාගැනීමට කටයුතු කර විගණනය වෙත ලබාදීමට කටයුතු කරන බව. | කාල විශ්ලේෂණ, උපයෝගී ලේඛණ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යනාදී සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාද 2016 සිට 2021 දක්වා වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.මිලියන 297.23 ක් හා රු.මිලියන 401.45 ක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රෝහල වෙත යොමු කරන ලද රෝගීන්ට සිදු කරන ලද හෘද සැත්කම් වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.මිලියන 748.55 ක මුදල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත පෙර වර්ෂය තුළ හිලව් කර තිබුණද මෙම මුදල් හිලව් කිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් අයවිය යුතු විශ්ව විද්‍යාල විද්‍යායතනය වෙනුවෙන් 2017, 2018 හා 2019 වර්ෂ තුළ රෝහල විසින් වැයකර තිබුණු රු.මිලියන 8.93ක මුදලද එසේ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වර්ෂය තුළ වෛද්‍ය සැපයුම් අංශය වෙත ගෙවිය යුතු මුදලින් හිලව්කර ගෙන තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ අදාල හිලව්කිරීම් සිදුකරනලද බව හා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡාකර ඉදිරියේදී මෙම මුදල් අයකරගැනීමට කටයුතු කරන බව. | භාණ්ඩාගාර අනුමැතියක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති | බඳවා ගැනීමේ පටිපාටිය පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, මෙම වාර්තාවේ දින වනවිටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මානව සම්පත් ගැටළු විසඳීම සඳහා ආයතනයෙන් බාහිර නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති බව හා එම කමිටුව මඟින් මානව සම්පත් ගැටළු නිරාකරණයෙන් අනතුරුව ලබාදෙන තොරතුරු මත බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමට තීරණය කර ඇති බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | රජයේ නිවාස භාවිතයේදී ජලය හා විදුලිය ගාස්තු නිලධාරියා විසින් ගෙවිය යුතුය. එසේ වුවද හෙද නේවාසිකාගාරවල ජල ගාස්තු ලෙස නේවාසිකයින්ගේ පරිභෝජනය නොසලකා එක් අයෙකුගෙන් මාසිකව රු.200 බැගින් හා Changing room සඳහා එක් අයෙකුගෙන් මාසිකව රු.25 බැගින් අයකර තිබුණු අතර නේවාසිකයන්ගෙන් විදුලිය ගාස්තු අයකර නොතිබුණි. | ජලය හා විදුලිය සඳහා නේවාසික පරිභෝජනය මැන බැලීමට මීටර් සවිකිරීමට කටයුතුකර ඒ අනුව අයකිරීම් සිදුකිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103 සහ 104 වගන්ති | වාහන අනතුරු හේතුවෙන් සිදුවන අලාභ සම්බන්ධයෙන් ඊට වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ පැවැත්විය යුතු වුවද මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන් | 2019 වර්ෂයේදී සිදුවී ඇති හදිසි අනතුරු සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකිරීම එම කාලය තුළ සිටි පරිපාලනය විසින් සිදුකර නොමැති බව හා වර්තමානයේදී සිදුවූ අනතුරු | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 අනුව පරීක්ෂණ පවත්වා අලාභයන් සඳහා වගකිවයුත්තන් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින බව. | |
| | (ii) මුදල් රෙගුලාසි 395 (ආ) සහ 395 (ඇ) ඡේද | බැංකු ගිණුම් සඳහා එක් එක් මාසය සඳහා සැසඳුම් ප්‍රකාශයක් ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කළ යුතු වුවත් රෝහලේ ප්‍රධාන ජංගම ගිණුමට අදාලව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාසය සඳහා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර තිබුණේ 2023 අප්‍රේල් 21 දිනදීය. | බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී එහි වෙනස්කම් පෙන්නුම් කළ බැවින් වැඩිදුරටත් පරීක්ෂා කිරීමට සිදුවූ බව හා එම නිසා නියමිත දිනට බැංකු සැසඳුම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව. | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2 මාර්ගෝපදේශය | හදිසි හා අත්‍යාවශ්‍ය අවස්ථාවක මිලදී ගැනීම් හැර මිලදී ගැනීම්වලදී තාක්ෂණික ඇගයීම් කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙක්, අවම අදාල විශේෂඥතාව සහිත උපදේශකවරුන් දෙදෙනෙක් හා මහා භාණ්ඩාගාරයෙන් නම් කරන ලද නියෝජිතයෙක්ගෙන් සමන්විත විය යුතු වුවද, රු.මිලියන 1.96 ක් වටිනා ශල්‍ය උපකරණ සහ රු මිලියන 9.76 ක් වටිනා X-Ray System උපකරණයට අදාලව මිලදී ගැනීම්වලදී ඒ අනුව සාමාජිකයන් පත් කර නොතිබුණි. | මින් ඉදිරියට සිදුවන ප්‍රසම්පාදනයන් සඳහා මෙම නියමය අදාල කරගැනීම සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) ගෙන් උපදෙස් ලබාගැනීමටත්, මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමටත්, රාජ්‍ය මුදල් අමාත්‍යාංශය වෙතටත් යොමුකර ඇති අතර ඉදිරියේදී එම උපදෙස් අනුව ක්‍රියා කිරීමට කටයුතු කරන බව. | 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 ඔක්තෝබර් 10 දිනැති අංක DMS/1758-Vol.1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය. | අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වනවිටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මානව සම්පත් ගැටළු විසඳීම සඳහා ආයතනයෙන් බාහිර නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති බව හා එම කමිටුව මඟින් මානව සම්පත් ගැටළු නිරාකරණයෙන් අනතුරුව ලබාදෙන තොරතුරු මත බඳවා ගැනීමේ පරිපාටිය සකස් කිරීමට තීරණය කර ඇති බව. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක PFD 08/2019 | අස්ථීත්වය විසින් සාප්පු ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කරනු ලබන මිලදීගැනීම 2020 ජනවාරි | ඉදිරියේදී ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛවලට අනුව කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය මඟින් සිදුකළ යුතු වුවත්, මෙම වාර්තාවේ දින වනවිටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | කළ යුතුය. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සංස්ථාමය පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.3 මාර්ගෝපදේශය | පනතේ අරමුණු ඉටුකරගත හැකිවන ලෙස උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව එවැනි සැලැස්මක් සකස්කර නොතිබුණි. | මේ වනවිට තුන් අවුරුදු උපාය මාර්ගික සැලැස්මෙහි පළමු කෙටුම්පත සකස්කර නිමකර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 247.23ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.මිලියන 254.19 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 501.42 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 730.78 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2020 සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ගෙවන වාට්ටුවලට අදාලව වෘත්තිය ගාස්තු ලෙස වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය වෙත ගෙවූ මුදල හා එම වාට්ටුවලින් රෝහල වෙත ලැබුණු ආදායම පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අයකළ වෘත්තිය ගාස්තුව | 363,441,668 | 363,748,356 | 514,552,338 |
| ගෙවන වාට්ටු වලින් ලද ආදායම | 232,400,926 | 284,583,346 | 342,927,187 |
| එකතුව | **595,842,594** | **648,331,702** | **857,479,525** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් පරිබාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතියකින් හෝ | වෘත්තීය ගාස්තු නියාමනය වන පොද්ගලික සෞඛ්‍ය සේවා නියාමන අධිකාරිය (PHRC) | ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතින් අනුව |

| | | | |
|---|---|---|---|
| | නිශ්චිත ප්‍රතිපත්තියකින් තොරව විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි වෘත්තීය ගාස්තු තීරණය කර තිබුණු අතර මෙම ගාස්තු තීරණය සඳහා සම්මත ප්‍රමිතීන් රෝහල තුළ ඇති කිරීමට පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි. | මඟින් මෙම ගාස්තුවල මිල පාලනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කොට ක්‍රියාත්මක කිරීමට උත්සහා කළ අවස්ථාවේදී එයට විරුද්ධ වූ පිරිසක් WRIT ආඥාවක් මඟින් මෙය වළක්වා ඇති බව හා නඩු විභාගය අවසන් වූ පසු එහි තීරණය අනුව ක්‍රියාත්මක වන බව. | සකස් කළ අයකිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂයේ ප්‍රධාන ශල්‍යාගාරයෙහි සාමාන්‍ය රාජකාරී වේලාව තුළ ගෙවන වාට්ටුවල රෝගීන් සඳහා සිදුකරන ලද ශල්‍යකර්ම 79 ක් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලින් බැහැරව රු.මිලියන 6.66ක් වෘත්තීය ගාස්තු ලෙස අය කර තිබුණි. | ශල්‍යාගාරය සහ ගිණුම් අංශය අතර ඍජු සම්බන්ධීකරණ ක්‍රමවේදයක් සකස් කොට මෙම කටයුතු නියාමනය කිරීම ආරම්භ කොට ඇති බව. | අමාත්‍ය මණ්ඩල තීරණය හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රෝහල් කාර්යමණ්ඩලයට අයත් නොවන බාහිර වෛද්‍යවරුන් 10 දෙනෙකු විසින් 2022 වර්ෂය තුළදී රෝහල් සම්පත් භාවිතා කරමින් ශල්‍යකර්ම සිදුකර තිබුණු අතර මෙම වෛද්‍යවරුන් විසින් 2022 වර්ෂය තුලදී රු.මිලියන 23.78 ක් වෘත්තීය ගාස්තු ලෙස රෝගීන්ගෙන් අය කර තිබුණි. එම මුදලින් රෝහල වෙත සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර තිබුණි. බාහිර වෛද්‍යවරුන් රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදවීමට හා වෘත්තිය ගාස්තු අයකිරීමට අදාළ අනුමැතීන් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. එම වෛද්‍යවරුන් සමඟ ගිවිසුමකට එළඹී නොතිබීම තුළ රෝගියාගේ වගකීම රෝහලට පැවරෙන බව නිරීක්ෂණය විය. | වෘත්තීය ගාස්තු මඟින් අදාල සේවා ගාස්තුව කළමනාකරණ වියදමක් ලෙස අයකරගත්තද, මේ සඳහා වැයවෙන අනෙකුත් වියදම් රෝගියාගෙන් අයකරගන්නා අතර එයට සියයට 35 ලාභාන්තිකයක් රෝහල අයකරගන්නා බව හා පරිභාහිරව පැමිණෙන විශේෂඥ වෛද්‍යවරුන් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කොට ඊට අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | බාහිර වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගැනීමේදි සුදුසු අනුමැතීන් ලබාගත යුතු අතර වගකීම් පිළිබඳ ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව සහායක වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා 2022 වර්ෂයේදී රු.මිලියන 110.28 ක් වෘත්තීය ගාස්තු ලෙස ගෙවා තිබුණි. | විශේෂඥ වෛද්‍යවරයෙකු ශල්‍ය කර්මයක් සිදුකිරීමේදී තවත් සහයක කණ්ඩායමකගේ සේවාව රාජකාරි වෙලාවෙන් පරිභාහිරව ලබාගැනීම අත්‍යාවශ්‍ය වන බව, මෙම කාලය සඳහා රජයේ මුදලින් අතිකාල ගෙවීමක් සිදු නොකරන අතර අදාළ වියදම ප්‍රතිපූර්ණය කරගන්නේ Out of Pocket ක්‍රමවේදය මඟින් බව හා මෙම අයකිරීමට රෝගියා ලිඛිතව එකඟතාවය ලබාදෙන බව. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 514.55කින් මණ්ඩලයේ ආදායමට බැරකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.773,312ක් පමණක් විය. 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවත්නා වෘත්තිය ගාස්තුවෙන් සියයට 0.15 ක සේවා ගාස්තුව කාලානුරූපීව අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමට රෝහල් පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි. | වෘත්තීය ගාස්තු මඟින් අදාල සේවා ගාස්තුව කළමනාකරණ වියදමක් ලෙස අයකරගත්තද, මේ සඳහා වැයවෙන අනෙකුත් වියදම් රෝගියාගෙන් අයකරගන්නා අතර එයට සියයට 35 ලාභාන්තිකයක් රෝහල අයකරගන්නා බව. | රෝහල විසින් වෘත්තීය ගාස්තු වෙනුවෙන් දරන පරිපාලන වියදම් අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඊ) | විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් සහායක කාර්යමණ්ඩලය වෙත ආපසු ගෙවා තිබුණු වෘත්තිය ගාස්තු මත උපයනවිට ගෙවීම් බදු අයකර නොතිබුණු අතර 2014, 2015 හා 2016 වර්ෂ සඳහා එසේ අඩුකර නොතිබුණු මුළු උපයනවිට ගෙවීම් බද්ද රු.මිලියන 108.52 ක් විය. | මේ පිළිබඳව බදු අභියාචනා කොමිසමෙහි අභියාචනයක් විභාග වන අතර එහිදී ලබාදෙන තීරණය අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට බලාපොරොත්තුවන බව. | බදු අභියාචනා කොමිසමේ තීරණය ලැබුණු පසු ඒ අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජෛව රසායනාගාරය තුළ පැවති උපකරණ 04 ක් රෝගී සාම්පල් පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කිරීම පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) Fully Automated chemistry Analyser-Abbott Architect C8000 උපකරණයට අදාළව දෛනික භාවිතය සැලකිල්ලට ගෙන යම් නිශ්චිත කාලයකට වරක් උපකරණයේ වූ දත්ත වෙනත් දත්ත ගබඩා ඒකකයක් වෙත ලබා ගැනීම (Backup ලබා ගැනීම) සිදුකර නොතිබුණි . | මෙම අංකය යටතේ දක්වා තිබෙන Abbott Architect C 8000 උපකරණයට අදාලව එහි දත්ත ගබඩා ධාරිතාව 50,000 පමණ වුවද එම යන්ත්‍රය මඟින් සිදු කරනු ලබන සියලු පරීක්ෂණ දත්ත ඒ මොහොතේම රෝහල් දත්ත ගබඩා පද්ධතියට හුවමාරුවන ක්‍රමවේදයක් මේ වනවිටත් ක්‍රියාත්මක වන බව, අවශ්‍ය දත්ත රෝහල් තොරතුරු පද්ධතිය හරහා ලබාගත හැකි බව. | දත්ත ගබඩාකර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ගත යුතුය. |
| (ii) එසේම මෙම උපකරණය සඳහා ප්‍රවේශය ලබා ගැනීමට රසායනාගාරය විසින් MLT මුර පදය වෙනුවට ADMIN මුර පදය භාවිතා කරමින් දත්ත ඇතුළත් කිරීම ,වෙනස් කිරීම සහ මකා දැමීම සිදුකළ හැකිව තිබු නිසා උපකරණය භාවිතයෙන් කොපමණ පරීක්ෂණ ප්‍රමාණයක් සිදුකර තිබුණේද යන්න පරික්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී සියලුම පරීක්ෂණ Barcode ක්‍රමය හරහා පමණක් සිදුවීමට අවශ්‍ය පද්ධති යාවත්කාලීන කිරීම් සිදුකිරීමට බලාපොරොත්තුවන බව. | උපකරණයට ප්‍රවේශ වීම සඳහා මුර පද භාවිතා කර අභ්‍යන්තර පාලනයන් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | රසායනාගාරය විසින් පවත්වාගෙන ගොස් තිබුණු ප්‍රතික්‍රියක හා අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය නිකුත්කිරීම් පොත සමාලෝචිත වර්ෂය තුළ යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් උපකරණ සඳහා කුමන දිනයන්හීදි ප්‍රතික්‍රියක නිකුත්කර තිබේද, අළුතින් ප්‍රතික්‍රියකයක් නිකුත්කරන අවස්ථාවේදී පැරණි ප්‍රතික්‍රියකයෙන් කොපමණ පරීක්ෂණ ප්‍රමාණයක් සිදුකර තිබේද, ප්‍රතික්‍රියකයෙන් අපේක්ෂිත පරීක්ෂණ ප්‍රමාණය ලබා ගැනීමට නොහැකි වුයේනම් ඊට හේතු වූ කරුණු මොනවාද යන්න සහ ඒවා රෝහල් කළමනාකරණයේ අධීක්ෂණයට ලක් කෙරෙන බවට තහවුරු කෙරෙන තොරතුරු රෝහල සතුව නොපැවතුණි. | ගබඩාවෙන් ප්‍රතික්‍රියක නිකුත් කරන්නේ SYSTOLIC පද්ධතිය මඟින් බව, මේ වනවිට සිදුකර ඇති පරීක්ෂණ සංඛ්‍යාව පද්ධතියෙන් ලබාගත හැකි බව, ඒ අනුව එක් ප්‍රතික්‍රියක කට්ටලයකින් සිදුකර ඇති පරීක්ෂණ සංඛ්‍යාව ලබාගත හැකි බව, කාර්යසාධනය මැන බැලීම සඳහා අවශ්‍ය තොරතුරු SYSTOLIC දත්ත පද්ධතියෙන් ලබාගැනිමේ හැකියාව රෝහල් කළමනාකරණයට ඇති බව. | ප්‍රතික්‍රියක හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය නිකුත් කිරීම පිළිබඳ ලේඛන යාවත්කාලීන කිරීම හා අධීක්ෂණයට ලක් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | රෝහලේ ස්ථාපිත තොරතුරු පද්ධතිය මඟින් සැපයෙන තොරතුරුවල නිවැරදිභාවය සහ කාලීනබව තහවුරු වන පරිදි අදාළ දත්ත තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම නිශ්චිත කාලරාමුවකින් තොරව අවස්ථා 11කදී රෝහල් තොරතුරු පද්ධතියට ඇතුළත් කර තිබුණි. | සෑම මසකම 25 වෙනි දින රෝහලේ සියලුම අංශවල පාරිභෝජ්‍ය ද්‍රව්‍යවල පරිභෝජනය පරිගණක පද්ධතිය තුළට ඇතුළත් කළයුතු බවට චක්‍රලේඛයක් නිකුත්කර ඇති අතර එම චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | දත්ත තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීමේදී නිශ්චිත කාලරාමුවක් තුළ සිදු කළ යුතුය. |
| (v) | රෝහල් තොරතුරු පද්ධතිය ප්‍රකාරව 2022 වර්ෂය තුළදී Fully Automated Chemistry Analyser-Abbott C8000 උපකරණය මඟින් සිදුකර තිබුණු පරීක්ෂණ වර්ග 27ක් වෙනුවෙන් භාවිතා කරන ප්‍රතික්‍රියක වර්ග 27කට අදාළව ප්‍රතික්‍රියක කට්ටල 203 ක් භාවිතා කර තිබුණු අතර ඒවායේ පිරිවැය රු.මිලියන 16.19 ක් විය. සම්මත භාවිතය අනුව සිදුකළ හැකි පරීක්ෂණ සංඛ්‍යාව 291,164 ක් පමණ වුවත් මාසික සංඛ්‍යාන පත්‍ර (Monthly Statistics Sheets) අනුව සිදුකර තිබුණු පරීක්ෂණ සංඛ්‍යාව 127,804 ක් හෙවත් සම්මත භාවිතයෙන් සියයට 44 ක අවම ප්‍රතිශතයක් ගෙන තිබුණි. බාහිර රෝගීන් සඳහා සේවා සැපයීම තුලින් රසායනාගාර උපකරණ ඵලදායී ලෙස යොදවා ගැනීම කෙරෙහි රෝහලේ කළමණාකරණය විසින් අවධානය යොමුකර නොතිබුණි. | සිදුකරනු ලබන පරීක්ෂණ පිළිබදව මාසික දත්ත වාර්තා සකසනු ලබන්නේ එම යන්ත්‍රයේ ගබඩාවී ඇති තොරතුරු පදනම් කර ගනිමින් බව.<br>විගණන විමසුමෙන් යෝජනා කරඇති පරිදි යන්ත්‍රයේ මතක ධාරිතාව දත්ත 200,000-300,000 පමණ තෙක් ඉහල දැමීම සඳහා සුදුසු ක්‍රමයක් සොයා බලන බව. | සියළුම උපකරණ උපරිම හා කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 ජුලි 16 දිනැති අංක 2080/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, පවිත්‍රතා සේවා කර්මාන්ත සේවයේ නියුතු වූවන් සඳහා රජය විසින් වැඩිකරන ලද දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල විසින් 2018 අගෝස්තු සිට 2018 ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ අරමුදල වෙත මුදල් ගෙවූ බවට රිසිට්පත් ලබාගැනීමකින් තොරව රු.මිලියන 2.30 ක මුදලක් හිඟ පවිත්‍රතා දීමනා ලෙස සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. | පවිත්‍රතා සැපයුම්කරුවෙකු වෙත ගෙවා ඇති රු.2,304,335 මුදල් ගෙවීම් සහතික කල නිලධාරියා ගිණුම් අංශයේ සේවයෙන් නික්ම ගොස් ඇති බව, | ගෙවීම් තහවුරු කිරීම සඳහා ලේඛණ ඉදිරිපත් කර නොතිබුණු බැවින් අදාල සමාගමෙන් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රෝහලේ නඩු සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගවලට අදාල ලිපිගොනු පරික්ෂාවේදි නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් කෙරේ. | | |
| | I. 2008 හා 2009 වර්ෂවලට අදාලව විශේෂඥ වෛද්‍යවරුන්ට ගෙවිය යුතු වන වෘත්තීමය ගාස්තු සම්බන්ධයෙන් වන වංචාවක් හෙළි වීමෙන් අනතුරුව මූලික විමර්ශනයක් 2012 වර්ෂයේදී පවත්වා අදාල විනය පරීක්ෂණයේ වාර්තාව අනුව වංචා කරන ලද රු.මිලියන 1.05 ක මුදල මාසයක් ඇතුළතදී ගෙවීමට අපොහොසත් වුවහොත් එම මුදල අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් මෙම මුදල අයකරගෙන නොතිබුණි. 2015 වර්ෂයේ නුගේගොඩ දිසා අධිකරණ නඩුව වර්ෂ 02 ක ප්‍රමාදයකින් පසුව පවරා තිබුණි. නඩුව සඳහා 2020/05/15, 2020/06/24, 2020/08/12 හා 2021/04/16 යන දින වලදී අදාල සාක්ෂි ඉදිරිපත් කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව විසින් ආයතන ප්‍රධානියා අමතා ලිපි එවා තිබුණද තොරතුරු ලබාදීමට වසරකට වැඩි කාලයක් ගතකර තිබුණි. | නඩු පැවරීම සඳහා ප්‍රමාද වූ හේතුව ලිපිගොනුව තුළින් සොයාගත නොහැකි බව, මෙම නඩුව පවරා ඇත්තේ 2015 වර්ෂයේ බව ලිපිගොනුව පරිශීලනයේදී පෙනියන බව හා නියමිත කාලය තුළ නඩු පවරා ඇති බැවින් කාලාවරෝධයක් සිදුවී නොමැති බව. | අධිකරණ කටයුතු සම්බන්ධව ආයතනය විසින් සිදු කල යුතු කටයුතු අප්‍රමාදීව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| | II. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ කළමණාකරණ සහකරුවකු ලෙස සේවය කරන ලද නිලධරයෙකු මුදල් වංචාවක් සිදුකිරීම සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික විමර්ශනයෙන් හා විනය පරීක්ෂණයෙන් අනතුරුව 2013 ජුලි 24 දින සිට සේවයෙන් ඉවත් කර තිබුණි. නිලධාරියා විසින් මේ සම්බන්ධයෙන් හෝමාගම කම්කරු විනිශ්චය සභාවේ පවරන ලද නඩුවෙන් හා ඊට අදාලව රෝහල විසින් පවරන ලද අභියාචන නඩුවේ නියෝගය අනුව සේවා බණ්ඩනයකින් තොරව සේවය කරමින් සිටි තනතුරේම වර්තමාන වැටුප් තලයේ රු.මිලියන 1.98 ක පසු වැටුප් සමඟ ඉල්ලුම්කරුව නැවත සේවයේ පිහිටුවිය යුතු බවට | මෙම නඩුවේ තීන්දුව ලබාදී ඇත්තේ සේවා බණ්ඩනයකින් තොරව, සේවය කරමින් සිටි ස්ථානයේම, සේවය කරමින් සිටි තනතුරේම, වර්තමාන වැටුප්තලයේ, රු.1,989,309 ක පසු වැටුප් සමඟ නැවත සේවයේ පිහිටුවන ලෙස බව.<br>ඒ අනුව අධිකරණ නියෝගය ප්‍රකාරව ඉල්ලුම්කරුව පසු වැටුප් සහිතව සේවයේ පිහිටුවීමට සේවා යෝජකට සිදුවී ඇති බව. | විධිමත් පරිදි මූලික පරීක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දන්වා තිබුණි. මේ අනුව සේවය නවතා තිබූ කාලපරිච්ඡේදයක් සඳහා වැටුප් ලෙස රු.මිලියන 1.98 ක නිශ්කාර්ය වියදමක් දැරීමට රෝහලට සිදුවී තිබුණි. | | |
| (ඇ) | රෝහලේ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා අරමුණු කරගෙන ඉදිකරන ලද ගොඩනැගිල්ල 2021 මැයි 08 දින රෝහල විසින් භාරගෙන තිබුණත් මෙම වාර්තාවේ දිනය දක්වාම අරමුණුගත කාර්යය සඳහා යොදවා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | බිම් මහල මුලික ඇස්තමේන්තුව මත ඉදිකළ කාර්ය සඳහා මේ වනවිටත් භාවිතා කරනු ලබන බව, තවද පළමු හා දෙවන මහලද මුලික සැලසුමෙහි සඳහන් කාර්ය සඳහා භාවිතා කිරීමට සැලසුම් සකස්වී ඇති අතර අවශ්‍යනම් Primary Care Centre සඳහා යොදාගැනීම සඳහාද ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය ලැබී ඇති බව. | ගොඩනැගිල්ල එලදායී ලෙස අනුමත කාර්යයන් සඳහා භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වෛද්‍ය කාර්යමණ්ඩලය, හෙද හා පරිපූරක අතුරු වෛද්‍ය සේවයේ කාර්යමණ්ඩලය වෙත අතිරේක රාජකාරී දීමනා, අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවීම් පිළිබඳ විගණන පරික්ෂාවේදී පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| | (i) 1996 ජුලි 17 දිනැති අංක 96/1347/120/143 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විවිධ ශ්‍රේණි සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමාන්තර ශ්‍රේණි හෝ අනෙකුත් දෙපාර්තමේන්තුවල සමාන්තර තනතුරු අතර වැටුප් පරතරය සියයට 35 ක් වන අයුරින් පවත්වා ගැනීම පොදු ප්‍රතිපත්තියක් ලෙස තීරණය කර තිබුණි. 2018 මාර්තු 15 දිනැති අංක 402:02:17 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ යටතේ වෛද්‍ය ,හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරී දීමනා හා අතිකාල දීමනා සඳහා සියයට 35 ක් එකතු කර චක්‍රලේඛය මගින් ලබාදෙන දීමනාවට වඩා ඉහළ රේට් අගයක පිහිටුවා පිළිවෙලින් 2020, 2021 හා 2022 වර්ෂවලදී රු.මිලියන 143.55, රු.මිලියන 168.45 හා රු.මිලියන 159.21 ලෙස ගෙවීම්කර තිබුණි. මේ සම්බන්ධයෙන් කැබිනට් අනුමැතියක් හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | චක්‍රලේඛයේ සඳහන් රේටයන්ට සියයට 35 එකතුකොට අතිකාල පැයක රේටය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව තීරණය කොට ඇති බව. | අදාල අධිකාරී අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) විගණනය විසින් නියැදි පරික්ෂාවට ලක් කරන ලද ප්‍රධාන ශල්‍යාගාරයෙහි පවත්වාගෙන යන ගෙවන වාට්ටුවල ශල්‍යකර්ම පිළිබඳ ලේඛණය හා වෛද්‍ය කාර්යමණ්ඩලයේ අමතර රාජකාරී | ශල්‍යාගාරය සහ ගිණුම් අංශය අතර සෘජු සම්බන්ධීකරණ ක්‍රමවේදයක් සකස්කොට මෙම කටයුතු නියාමනය කිරීම | මෙම මුදල් රෝහල් ආදායමට බැර කිරීමට |

| | | |
|---|---|---|
| ගෙවීම් වවුචර් සැසඳීමේදී අතිරේක රාජකාරි දීමනා ලබාගත් කාලසීමාව තුළ වෛද්‍ය කාර්යමණ්ඩලය විසින් පෞද්ගලික සේවයේ යෙදී ශල්‍යකර්ම සිදුකිරීම වෙනුවෙන් වෘත්තිය ගාස්තු ලෙස රු.මිලියන 5.45 ක්ද අයකර තිබුණි. | ආරම්භකොට ඇති බව හා ඒ අනුව ඉදිරියේදී මෙම ක්‍රියාවලිය විධිමත් ආකාරයට සිදුවනු ඇති බව. | කටයුතු කළ යුතුය. |
| (iii) වෛද්‍ය කාර්යමණ්ඩලය වෙත නිවාඩු දින දීමනා ගෙවීම් සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී ඇතැම් වෛද්‍ය නිලධාරීන් විසින් නිවාඩු දින දීමනා ලබාගත් කාලසීමාව තුළද පෞද්ගලික සේවයේ යෙදී වෘත්තිය දීමනා අයකර තිබුණු බව නිරීක්ෂණය විය .නියැදි පරීක්ෂාවට භාජනය කල ප්‍රධාන ශල්‍යාගාරයෙහි ගෙවන වාට්ටුවල සැත්කම් ලේඛණය අනුව එසේ වෛද්‍ය නිලධාරීන් 07 දෙනෙකු විසින් අයකර තිබුණු වෘත්තිය දීමනා මුදල රු.මිලියන 2.96 ක් විය. | ඉහත දක්වා ඇති නියාමනයේදී එම ගැටලුවද විසදා ගැනීමට හැකි බව. | මෙම මුදල් රෝහල් ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

(ඊ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 05 ක රෝහලේ සමස්ත කාර්ය සාධනය පහත පරිදි විය.

| | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
|---|---|---|---|---|---|
| රෝහලේ ඇඳන් සංඛ්‍යාව | 1,061 | 1,065 | 1,072 | 993 | 1008 |
| ඇඳන් භාවිතය (%) | 66 | 69 | 52 | 54 | 55 |
| ඇතුලත් වූ රෝගීන් සංඛ්‍යාව | 58,849 | 62,466 | 45,976 | 39,916 | 42,633 |
| සායන සඳහා රෝගීන් සහභාගී වීම | 182,170 | 190,716 | 138,502 | 136,085 | 153,143 |
| බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව | 22,992 | 23,010 | 16,307 | 13,337 | 19,537 |
| සම්පූර්ණ මරණ සංඛ්‍යාව | 745 | 847 | 594 | 813 | 721 |
| සිදු කර ඇති විවිධ පරීක්ෂණ සංඛ්‍යාව | 1,507,104 | 1,663,527 | 1,244,598 | 1,241,800 | 1,251,270 |
| සිදු කර ඇති විවිධ ශල්‍යකර්ම සංඛ්‍යාව | 15,231 | 15,347 | 12,388 | 11,109 | 13,100 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | | |
|---|---|---|
| (i) 2018 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ රෝහලේ ඇඳන් සංඛ්‍යාව සියයට 5 කින් හා ඇඳන් භාවිතය සියයට 11.5 කින් අඩු වී තිබුණි. 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ ඇඳන් සංඛ්‍යාව 15 කින් වැඩි වී තිබූ අතර, ඇඳන් භාවිතය සියයට 1 කින් වැඩි වී තිබුණි. | කොවිඩ් වසංගත සමයේ ඇඳන් අතර පරතරය වැඩිකර ගැනීමට අවශ්‍ය වූ නිසා, මේ ආකාරයට ඇඳන් සංඛ්‍යාව අඩුකර ඇති බව. | රෝහල වෙත රෝගීන් පැමිණීම් වර්ධනය කළ හැකි වැඩපිළිවෙලක් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) රෝහල විසින් කරනු ලබන පරීක්ෂණ හා ශල්‍යකර්මවල ප්‍රගතියේ පහළ යාමක් නිරීක්ෂණය වූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ පරීක්ෂණ 9,470 ක සහ ශල්‍ය කර්මවල 1,991 ක වර්ධනයක් නිරීක්ෂණය විය. | මෙම නිරීක්ෂණය සමඟ එකඟවන බව. | රෝහල වෙත රෝගීන් පැමිණීම් වර්ධනය කළ හැකි වැඩපිළිවෙලක් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) 2021 වර්ෂයට සාපේක්ෂව රෝහලට ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව, සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව හා බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 7, 13 හා 46 කින් වර්ධනය වී තිබුණි. | කොවිඩ් වසංගතය සහ ඉන්ධන අර්බුදය හේතුවෙන් රෝහල වෙත පැමිණි රෝගීන් සංඛ්‍යාව අඩුවූ බව.<br>නමුත් 2021 ට සාපේක්ෂව 2022 වර්ෂයේ ඇතුළත් වූ රෝගීන්ගේ සහ සායනික රෝගීන්ගේ වැඩිවීමක් සිදුවී ඇති බව. | රෝහල වෙත රෝගීන් පැමිණීම් වර්ධනය කළ හැකි වැඩපිළිවෙලක් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020/2021 වර්ෂය සඳහා රු.මිලියන 4.65 ක මුදලකට කසල ඉවත් කිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුව දුන් පෞද්ගලික සමාගම වෙත 2022/2023 වර්ෂය සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.මිලියන 7.25 ක මුදලකට පිරිනමා තිබුණි .ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | | |
| (i) රෝහලේ දිනකට ඉවත් කරන සාමාන්‍ය මිශ්‍ර කසල ප්‍රමාණය කි.ග්‍රෑ. 400-500 අතර පවතින බව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් හඳුනාගෙන තිබුණද ගිවිසුම අනුව කි.ග්‍රෑ. 5,000 ක් පැටවිය හැකි ලොරි රථයක් දිනපතා රෝහලට පැමිණෙන බව නිරීක්ෂණය විය. ඒ අනුව ටෙන්ඩර් කැඳවීමට පෙර රෝහලේ දෛනික කසල එකතුවන ප්‍රමාණය අධ්‍යනය කර රෝහලේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රසම්පාදනය කර නොතිබීමෙන් රෝහලට පාඩුවක් සිදුවී තිබුණි. | මේ ක්‍රියාවලිය තුළින් රෝහලට මූල්‍යමය හානියක් ඇතිකරන බව හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් මහරගම ප්‍රාදේශීය ලේකම්, අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ, මහරගම ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් එකතුවී කසල ඉවත්කිරීමේ ක්‍රමවේදයක් සාකච්ඡා කරන ලද බව හා එම සාකච්ඡාවේ ගත් තීරණ ක්‍රියාත්මකවූ පසු කසළ ඉවත්කිරීම සම්බන්ධයෙන් අවසන් එකඟතාවයට පැමිණීමට බලාපොරොත්තුවන බව. | දෛනිකව එකතුවන කසල ප්‍රමාණය අධ්‍යයනය කර අවශ්‍යතාවය නිශ්චය කර කොන්ත්‍රාත් පිරිනැමීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) | කසල ඉවත්කරගෙන යාම සඳහා ලොරි රථය නියමිත කාලය තුළ රෝහලට පැමිණිය යුතු වුවද, නියැදි පරික්ෂාව අනුව දින 70 ක් නියමිත කාලය තුල නොපැමිණ ඇති බව නිරීක්ෂණය වූයෙන් ගිවිසුමේ 7(ආ) පරිදි නියමිත අධීක්ෂණ ක්‍රියාවලිය සිදුවී නොතිබුණි. | නියමිත වේලාවට එනම්, සවස 3.00-6.00 අතර පැමිණ එම රාජකාරිය ඉටුකරන ලෙස රෝහල විසින් දැනුම් දීමෙන් පසු මේ වනවිට බොහෝ දුරට මෙම කාරණය නිවැරදිවී ඇති බව.<br><br>කසල පැටවීමේදී ආරක්ෂක නිළධාරියකු සහ එදින රාජකාරියේ නියුතු මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු නිසිලෙස සිදුකරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අධීක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |
| | (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිම කිරීමට අපේක්ෂිත දිනයට පසුව දින 28 ක් දක්වා වලංගු වන පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවද ඉදිරිපත් කර ඇති සුරක්ෂණය මගින් අදාල කාලපරිච්ඡේදය ආවරණය වී නොතිබුණි. | අතපසුවීමක් සිදුවී ඇති බව පිළිගන්නා බව, ඉදිරි ටෙන්ඩර්වලදී මේ පිළිබඳ අවධානය යොමු කිරීමට කටයුතු සිදුකර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020/2021 වර්ෂයට අදාලව පෞද්ගලික සමාගමක් සමඟ එළඹි 2020 දෙසැම්බර් 30 දිනැති ආරක්ෂක සේවා සැපයීමේ ගිවිසුම ප්‍රකාරව මාසිකව රු.මිලියන 2.46 ක වැට් සහිත කොන්ත්‍රාත් වටිනාකමකට 2020 නොවැම්බර් 01 දින සිට වර්ෂයක කාලයක් සඳහා සේවා සැපයීමට එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | | |
| | (i) | වාර්ෂික ප්‍රසම්පාදනයකින් තොරව මාස 14 ක කාලයක් වරින් වර කාලය දීර්ඝ කරමින් ආරක්ෂක සේවාව සපයාගෙන තිබුණු අතර අවස්ථා 2කදී නියමිත පරිදි සේවා ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙයට අදාල ප්‍රසම්පාදන කටයුතු පවතින කොන්ත්‍රාත්තුව අවසන්වීමට මාස 4 ට පමණ පෙර සිට ආරම්භකර තිබූ නමුත් ලංසු ලේඛන නිර්දේශ ලබාගැනීම සහ ලංසු ඇගයීම් කටයුතුවල පැවති ප්‍රමාදයන් මත, පැවති කොන්ත්‍රාත්තුව දීර්ඝකිරීමට සිදුවී ඇති බව, මේ වනවිටත් මෙවැනි අතපසුවීම් වලක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව. | වාර්ෂික ප්‍රසම්පාදනයන් සිදුකිරීමට හා ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | සේවා ගිවිසුමේ 2(c) වගන්තිය ප්‍රකාරව මාසික බිල්පත් ඉදිරිපත් කිරීමේදී පසුගිය මාසයට අදාලව සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට මුදල් ගෙවූ රිසිට් පතෙහි පිටපතක් සේවා සපයන ආයතනය විසින් ඉදිරිපත් කල | අදාල සේවා සපයන්නාගෙන් සේවක අර්ථසාධක සහ සේවක භාර අරමුදලට අදාල ගෙවීම් සනාථ කරන සහතිකය ගෙන්වාගෙන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යුතු බව දක්වා තිබුණද අදාල සනාථ කිරීම් ලබා ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | | |
| (iii) | 2021/2022 සේවා ගිවිසුමේ සඳහන් පරිදි දිවා කාලයේ සේවයේ යෙදවිය යුතු සේවක සංඛ්‍යාව 42 ක් වන අතර 2022 වර්ෂයේ මාස 07ක් තුළ දිවා කාලයේ සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 21 ත් 38 ත් අතර පරාසයක පැවතුණි. ඒ අනුව අපේක්ෂිත පරිදි නිසි ආරක්ෂක සේවාවක් අදාල සමාගම වෙතින් ලැබෙන්නේද යන්න ගැටලු සහගත විය. | අඩු සේවක සංඛ්‍යාව වෙනුවෙන් මාසිකව ගෙවන මුදලින් දඩ මුදල් අයකරන බවත්, නියමිත සේවක සංඛ්‍යාව පවත්වාගෙන යන ලෙස නිරන්තරයෙන් උපදෙස් ලබාදෙන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2021/2022 සහ 2022/2023 යන වර්ෂයන්ට අදාළව රෝහල් පිරිසිදු කිරීමේ සේවාව පුද්ගලික සමාගම් දෙකකට පවරා තිබුණි. මෙම සමාගම් විසින් රෝහලේ පිරිසිදු කිරීමේ සේවාවන් පවත්වාගෙන යාම, රෝහල විසින් මෙම සේවාව ලබාගැනීම හා ඒ වෙනුවෙන් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | පිරිසිදු කිරීමේ සේවා සැපයීමේදී භාවිතා කරනු ලබන සියළුම පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ හෝ කාර්මික තාක්ෂණ ආයතනයේ අනුමත සහ ඒවායේ ගුණත්වය පිළිබඳව තහවුරු කර තිබිම ගිවිසුම් කොන්දේසියක් ලෙස සේවා ගිවිසුම්වල ඇතුළත්ව තිබුණත් ඒ බව තහවුරු කර ගැනීමට අවශ්‍ය කෙරෙන රසායනාගාර පරීක්ෂණ වාර්තා ලංසු ලේඛන මඟින් ඉල්ලා නොතිබීම හේතුවෙන් ලංසුකරුවන් ලබා දීමට එකඟවන පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකා ප්‍රමිතින්ට (SLS Standards) අනුකූල ඒවාද යන්න සහ එම පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය වෙනුවෙන් ලංසුකරුවන් ඉදිරිපත් කරන ලද මිල ගණන් සාධාරණද යන්න ඇගයීම් කර නොතිබුණි. | ටෙන්ඩර් කැඳවන අවස්ථාවේදී මේ පිළිබඳව අවධානය යොමුකර නොමැති බව පිළිගන්නා අතර, ටෙන්ඩර් ක්‍රියාත්මක කිරීමේදී සැපයුම් කරනු ලැබූ සාම්පල අදාල පරීක්ෂාව සඳහා ITI වෙත යොමුකර ඇති බව. ඉදිරි ටෙන්ඩර්වලදී ටෙන්ඩර් කොන්දේසිවල ඇතුළත් කරුණු ඇගයීම් කටයුතු සිදු කිරීමේදී සලකා බැලීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව. | භාවිතා කරනු ලබන සියළුම පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ හෝ කාර්මික තාක්ෂණ ආයතනයේ අනුමත කර තිබිය යුතුය. |
| (ii) | සැපයුම්කරුවන් විසින් ලබා දිය යුතු වන පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍ය පිළිබඳව අවම නිර්ණායකයන් | ටෙන්ඩර් කැඳවන අවස්ථාවේදී මේ පිළිබඳව අවධානය යොමුකර නොමැති බව පිළිගන්නා අතර, ටෙන්ඩර් | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ස්ථාපිත කර නොතිබීමෙන් ගිවිසුම් ප්‍රකාරව වරින් වර පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍යයේ ගුණාත්මකභාවය තහවුරු කර ගත යුතු වුවත් ,එසේ කර නොතිබුණි. පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍යයන් 6කට අදාළව කාර්මික තාක්ෂණ ආයතනය විසින් නිකුත්කර තිබුණු රසායනාගාර පරීක්ෂණ වාර්තා අනුව රසායන ද්‍රව්‍ය 05ක් නියමිත ප්‍රමිතියෙන් තොර ඒවා බවට තහවුරු කර තිබුණි. 2021/2022 ගිවිසුම්ගත වර්ෂය වෙනුවෙන් යථෝක්ත රසායන ද්‍රව්‍ය වෙනුවෙන් රෝහල විසින් සැපයුම්කරු වෙත ගෙවන ලද රු.665,639 ක මුදල අනාර්ථික ගෙවීමක් ලෙස නිරීක්ෂණය වූ අතර 2022/2023 ගිවිසුම් වර්ෂයට අදාළවද ප්‍රමිතිය පිළිබඳ පරීක්ෂාවකින් තොරව රසායන ද්‍රව්‍යය ලබා ගෙන 2022 දෙසැම්බර් සහ 2023 ජනවාරි මාස වෙනුවෙන් රු.338,900 ක මුදලක් ගෙවා තිබුණි. | ක්‍රියාත්මක කිරීමේදී සැපයුම් කරනු ලැබූ සාම්පල අදාල පරීක්ෂාව සඳහා ITI වෙත යොමුකර ඇති බව. ඉදිරි ටෙන්ඩර්වලදි ටෙන්ඩර් කොන්දේසිවල ඇතුළත් කරුණු ඇඟයීම් කටයුතු සිදු කිරීමේදී සලකා බැලීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව. | |
| (iii) | රෝහලට මාසිකව ලැබෙන පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය තොග රෝහලේ මහජන සෞඛ්‍ය පරීක්ෂක භාරයේ හා පිරිසිදු කිරීමේ සේවාව සපයන ආයතනය භාරයේ තබා ගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් 2023 ජනවාරි 25 දින කරන ලද භෞතික පරික්ෂාවේදී රෝහල සතුව පැවති තොග ප්‍රමාණයන්ට වඩා රෝහලේ පරිගණක පද්ධතිය මඟින් එදිනට පෙන්වන තොග ප්‍රමාණය අතර ලීටර් 5 සිට 160 දක්වා වූ පරාසයක වෙනස්කම් පැවතුණි. | පිරිසිදු කිරිමේ ද්‍රව්‍යවලට අදාල පරිගණක පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කිරීම් සිදුකර මෙවැනි තොග ශේෂ නොගැලපීම් යලි ඇති නොවීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | රසායනික ද්‍රව්‍ය තොග සම්බන්ධව නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතුය. |
| (iv) | ගිවිසුම් කොන්දේසි (ඊ) ප්‍රකාරව සැපයුම්කරු විසින් ලබා දෙන ලද පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා උපකරණ එක් එක් අංශයන්හී අවශ්‍යතාවය පරිදි අංශ ප්‍රධානින් වෙත රෝහලේ ගබඩා භාරකරු විසින් නිකුත්කල යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර රෝහලේ පවතින සැපයුම්කරුගේ ගබඩාව වෙත පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය පදනමකින් තොරව නිකුත්කර තිබුණි. එහිදී | මෙම පිරිසිදු කිරිමේ ද්‍රව්‍ය ප්‍රධාන ගබඩාව මඟින් නිකුත් කරනුයේ රෝහල් අංශ ප්‍රධානීන් වෙත පමණක් බව, කොසු, මොප් වැනි ද්‍රව්‍ය රෝහලේ අංශ ප්‍රධානීන් විසින් පරිගණක පද්ධතිය හරහා ඇනවුම් කල පසු ප්‍රධාන ගබඩාව මගින් මහජන පරීක්ෂක වෙත පිරිසිදු කිරිමේ ද්‍රව්‍ය නිකුත් කරන අතර අවශ්‍යතාවය අනුව සැපයුම්කරුගේ ගබඩාව වෙත රසායනික ද්‍රව්‍ය නිකුත් කරනුයේ | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

සැපයුම්කරුගේ ගබඩාවේ ඉතිරි තොග පිළිබඳ සැලකිල්ලට ගෙන නොතිබුණි. මේ හේතුවෙන් පෙර ගිවිසුම් වර්ෂයට අදාළවන ලීටර 245 ක Glass Cleaner තොගයක් සැපයුම්කරුගේ ගබඩාවේ පැවතුණු අතර මාසික අවශ්‍යතාවය ඉක්මවූ පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය තොග ගබඩාවල පවතින බව නිරීක්ෂණය වූ අතර මාසිකව සැපයිය යුතුවන පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා උපකරණ සැපයුම්කරුගේ අභිමතය පරිදි රෝහල වෙත සැපයීමට ඉඩ හැරීම, රෝහලේ පරිගණක පද්ධතිය මඟින් හෙළිදරව් නොවන පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය තොග පැවතීම සහ නිසි අධීක්ෂණයකින් තොරව මාසික අවශ්‍යතාවය ඉක්මවූ පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය තොග පවත්වා ගැනීමට ඉඩ හැරීම නිසා පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සම්බන්ධයෙන් විවිධ අක්‍රමිකතාවයන් සිදුකිරීමේ අවදානමක් පැවතුණි.

මහජන පරීක්ෂක විසිනි. ප්‍රධාන ගබඩාව විසින් ඉදිරි ඇනවුම් සඳහා සලකා බලනුයේ ප්‍රධාන ගබඩාව තුළ ඇති තොග සහ අංශ ප්‍රධානීන්ගේ ඇණවුම් සැළකිල්ලට ගනිමින් බව. පිරිසිදු කිරිමේ ද්‍රව්‍ය සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව.

(ඈ) 2016 නොවැම්බර් 03 දින රු.මිලියන 23.54 ක වැට් සහිත මුදලකට පෞද්ගලික ආයතනයක් වෙතින් මිලදී ගෙන තිබුණු සායනික අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රය 2016 දෙසැම්බර් සිට වර්තමානය දක්වා පෞද්ගලික ආයතනයක් සහ රෝහල් කාර්යමණ්ඩලය විසින්ද භාවිතාකර රෝහල් සායනික අපද්‍රව්‍ය පුළුස්සා තිබුණි. මෙම යන්ත්‍රය උපයෝජනය හා නඩත්තුව පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) යන්ත්‍රයේ නඩත්තු කටයුතු අඩු පිරිවැයකින් හා කාර්යක්ෂමව රෝහලේ නඩත්තු කාර්ය මණ්ඩලය මඟින් සිදු කරගත හැකි බව දක්වමින් යන්ත්‍රය මිලදී ගැනීමේදී නඩත්තු සේවා පිරිවැය ඇතුළත්ව යන්ත්‍රයේ පිරිවැය ඇගයීමකට ලක්කර නොතිබුණු අතර, නඩත්තු සේවා ගිවිසුමකින් තොරව යන්ත්‍රය පමණක් මිලදීගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබීමෙන් වර්ෂ 02ක වගකීම් කාලයෙන් පසු වර්ෂ 6ක් දක්වා වූ නඩත්තු සේවා

මෙම මූලික ටෙන්ඩරය තුළ වූ තාක්ෂණික කමිටු නිර්දේශ හා ප්‍රසම්පාදන කමිටු අනුමැතීන් ඵලදායී ලෙස යෙදවී නොමැති බව පිළිගන්නා බව, ඒ අනුව රෝහල් කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම හා වෙනත් විකල්ප නොතිබීම මත එම සැපයුම්කරු සමඟ සේවා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සිදුකර ඇති අතර රෝහලට ඉතිරි කරගැනීමට අපේක්ෂා කළ රුපියල් මිලියන 10 ක මුදල ඉතිරි කරගත නොහැකි වූ බවද පිළිගන්නා බව.

යන්ත්‍ර පිරිවැය ගණනය කිරීමේදී නඩත්තු සේවා පිරිවැය පිළිබඳවද ඇගයීමකට ලක් කළ යුතු අතර රෝහලට අවාසි දායක නොවන පරිදි ප්‍රසම්පාදන තීරණ ගත යුතුය.

| | | | |
|---|---|---|---|
| | ඇතුලුව අවම මිල ටෙන්ඩරය වූ රු.මිලියන 26.35 ක ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර තිබුණි. 2023 පෙබරවාරි 10 විගණිත දින වන විට එළඹ තිබුණු සේවා ගිවිසුම් ප්‍රකාරව එකතුව රු.මිලියන 4.01ක් සේවා ගාස්තු ලෙස රෝහල විසින් වැයකර තිබුණි .ඒ අනුව යන්ත්‍රය මිලදී ගැනීමේදී නඩත්තු වියදම් යන්ත්‍රයේ මිලට එකතු නොකර ඇගයීම් කිරීමෙන් අවුරුදු 06ක කාලයක් ඇතුළත රු.මිලියන 10 ක මුදලක් රෝහලට ඉතිරි කර ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණය ඵලදායී වී නොතිබුණි. | | |
| (ii) | සායනික අපද්‍රව්‍ය දහන යන්ත්‍රය (Incinerator) මඟින් රෝහල තුළ දෛනිකව සායනික අපද්‍රව්‍ය පිළිස්සීම සිදු කරන අතර ඉන් ඉතිරි වන අළු බැහැර කරන කොන්ක්‍රීට් වලවල් දැනටමත් සම්පූර්ණයෙන් පිරී ඇති බැවින් වර්තමානයේ නිසි ක්‍රමවේදයකින් තොරව රෝහල් පරිසරයට හානිදායක වන අයුරින් අළු බැහැර කර තිබුණි. යන්ත්‍රයෙන් ඉවත් කරන අළු එළිමහනේ ගොඩ ගැසීම නිසා ඉදිරි වර්ෂා සහිත කාලය තුළ රෝහල් භූමිය තුළ සෞඛ්‍ය තර්ජනයක් ඇති විය හැකි බවත් මේ හේතුවෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගන්නා පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) අළුත් කිරීමේදී කොන්දේසි කඩ කිරීමක් මත අපද්‍රව්‍ය දහන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේ අවසරයද අහිමි වීමේ අවදානමක් පවතින බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | ඉහත සඳහන් කළ දහන යන්ත්‍රය (Clinical Waste Incinerator) නිසි ආකාරව ක්‍රියාත්මක නොවන නිසා ඒ පිලිබඳ අදාල ආයතනය මඟින් අලුත්වැඩියා සිදුකළද තවමත් එය සාර්ථකවී නොමැති බව, එම නිසා සායනික අපද්‍රව්‍ය නිසි ආකාරව දහනය නොවන නිසා දහන යන්ත්‍රය මඟින් අළුවලට අමතර කාබන් අඩංගු භාගයට දැවුනු කොටස් විශාල වශයෙන් ඉතිරිවන බව, එම නිසා Ash pit පිරීම වේගවත් වී ඇති අතර එම අළු බැහැර කිරීමේ ගැටලු සහගත තත්වයකට පත්ව ඇති බව, | පරිසරයට හානිදායක නොවන අයුරින් අපද්‍රව්‍ය බැහැර කිරීමට නිසි වැඩ පිළිවෙලක් සකස් කල යුතුය. |
| (ඉ) | රෝහලේ වැඩහල සහ උද්‍යාන පවිත්‍ර කිරීමේ කාර්යමණ්ඩලය සඳහා කාර්යාල පවත්වා ගෙන යාම සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 87.02 ක (වැට් රහිත) මුදලකට 2016 නොවැම්බර් 09 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භයේදී වැඩහල පැවති ගොඩනැගිල්ල කඩා ඉවත්කිරීම හේතුවෙන් මසකට රු.257,000 ක මුදලකට | කොන්ත්‍රාත්තුව නියමිත කාලය තුළ සිදුනොවීම මත කන්ටේනර් කුලී කාලයද දීර්ඝ කළයුතු වූ බව, මේ වනවිට අදාල කන්ටේනර් කීපයක් නිදහස්කර ඇති බව. | ඉදිකිරීම් කටයුතු නියමිත කාලසීමාවන් තුළ සිදුකර ගැනීමට පියවර ගත යුතුය. |

කන්ටේනර් 12ක් කුලියට ගෙන තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2018 අප්‍රේල් මාසය වනවිට ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට මාස 56 ක් වෙනුවෙන් රු.මිලියන 14.39 ක අතිරේක කුලී වියදමක් දැරීමට සිදුවී තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුරප්පාඩු වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව තාවකාලික පදනමින් වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරියෙකු 2021 ජුලි 28 දින සිට පත්කර ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.7 වගන්තියට පටහැනිව වැඩ ආවරණය කිරීමේ පත්කිරීමකට අදාලව දීමනා ලෙස රු.මිලියන 1.19 ක්ද, වැටුප් ලෙස රු.මිලියන 2.98 ක්ද ගෙවා තිබුණි. අමතර රාජකාරී දීමනා ලෙස රු.මිලියන 2.69 ක් ගෙවීමට අදාලව පවරා ඇති අමතර රාජකාරී පිළිබඳ රාජකාරී ලැයිස්තුවක් විගණනයට ඉදිරිපත් නොවීය. මේ වනවිට වර්ෂ 1½ කට අධික කාලයක් සේවයේ යොදවා තිබුණු අතර ස්ථිර පදනමින් පුරප්පාඩුව පිරවීමට විගණිත දිනය වන 2023 මාර්තු 24 දින තෙක් කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශ ලිපියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරයේ 'රාජකාරී ආවරණය' (Covering Up) ලෙස සඳහන් වුවද, මෙම නිලධාරියා යොදවා ඇත්තේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරයේ නිත්‍ය රාජකාරී සඳහා පූර්ණ කාලීන (Full Time) පදනම යටතේ බව, වැඩ බැලීමේ දීමනාව නතර කොට, එය ගෙවූ දින සිට අයකර ගැනීමට කටයුතු කරන බව හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරයට ස්ථිර සේවකයෙකු බඳවා ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට හා ස්ථිර පදනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දින වනවිට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු වර්ග 02 ක් සඳහා නිලධාරීන් 231 දෙනෙකු හා අනුමත කාර්යමණ්ඩලය තුළ නොවූ තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 09 දෙනෙකු පත්කර තිබුණි. | සියළු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමේදී හා (තාවකාලික/ කොන්ත්‍රාත්) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සිදුකරනු ලබන බව, රෝහල් කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ අරමුණින් රෝහල තුළ පැවති එම තනතුරු පිරවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සිදුකර ඇති බව හා එම සංඛ්‍යාව 196 ක් පමණ බව. | බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර රෝහල සතුව වාහන 16 ක් පැවති අතර එම වාහන සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | ජාතික අයවැය චක්‍රලේඛ 150 පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් වාහන 6 ක් රෝහලට ලැබී වසර 05 ක් ඉක්මවා තිබුණද, මෙම වාර්තාවේ දින වනවිටත් රෝහලට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි . | සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ලංකා බැංකුවෙන් අදාල තොරතුරු ඉල්ලා ඇති අතර එම තොරතුරු ප්‍රමාද වීම මත මෙම පවරා ගැනීම ප්‍රමාද වී ඇති බව හා ඉදිරියේදී එම වාහන පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට එකතු කිරීමට කටයුතු කරන බව. | වාහන පවරා ගැනීමට අප්‍රමාදීව කටයුතු කළ යුතුය. |
| (ii) | 2018 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයෙන් මෙම රෝහලට ලැබී ඇති වාහනයක් 2019 නොවැම්බර් 22 දින සිදුවූ හදිසි අනතුරක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. 2022 ඔක්තෝබර් 20 දින පෞද්ගලික සමාගමක් ඉදිරිපත් කළ රු.489,200 ක ඇස්තමේන්තුව අනුව අළුත්වැඩියාව සඳහා යවා තිබුණද අනතුර සිදුවී වසර 03 කටත් අධික කාලයක් ඉකුත් වී තිබීම හේතුවෙන් එම වියදම් රක්ෂණ හිමිකම මඟින් ආවරණය කර ගැනීමට හැකියාවක් තිබේද යන්න ගැටළු සහගත විය . | හදිසි අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි 103 හා 104 පරිදි කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | රෝහල සතු වාහන 03ක් අළුත්වැඩියාවන් නිසි දිනයන්ට සිදුකර ගැනීමට නොහැකි වීමෙන් 2023 මාර්තු 10 වනවිටත් ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ පැවතුණි . | මෙම වාහනවලට අමතර කොටස් සොයාගැනීමට ඇති අපහසුතාවය හා ඒ අනුව මිල ගණන් ඉදිරිපත් කිරීමට කාලය ගතවී ඇති බවත් අමතර කොටස් ලැබු විගස අළුත්වැඩියාවන් කඩිනමින් කරදෙන බවත් එම ආයතනයේ ප්‍රධානීන් විසින් දැනුම්දෙන ලද බව. | වාහන අළුත්වැඩියාවන් කඩිනමින් සිදු කරගැනීමට කටයුතු කළ යුතුය. |